# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,145 - 2019 ඔක්තෝබර් මස 11 වැනි සිකුරාදා - 2019.10.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | — |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 624 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2019 නොවැම්බර් මස 01 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 ඔක්තෝබර් මස 18 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# විවිධ දැන්වීම්

## සිය සිවිල් අධිකරණ බලය කොළඹ දී ක්‍රියාත්මක කරනු ලබන බස්නාහිර පළාත්බද මහාධිකරණයේ දී ය

නඩු අංකය : HC (Civil) 66/19/CO
ස්වභාවය : ගණන් බේරා වසා දැමීම
කාර්ය පටිපාටිය : ලඝු
වටිනාකම : රු.

රත්මලාන, කටුකුරුඳුවත්ත පාරේ, අංක 24 දරන ස්ථානයේ ලීඩර් හෝල්ඩිංග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් පිළිබඳ කාරණය සම්බන්ධයෙනි.

*සහ*

2007 අංක 07 දරන සමාගම් පනතේ xii දරන කොටස යටතේ අධිකරණය මගින් ගණන් බේරා වසා දැමීම සඳහා අයදුම්පත පිළිබඳ කාරණය සම්බන්ධයෙනි.

රත්මලාන, කටුකුරුඳුවත්ත පාරේ, අංක 24 දරන ස්ථානයේ ලීඩර් හෝල්ඩිංග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

................................*පෙත්සම්කරු.*

කොළඹ දී පවත්වනු ලබන (සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන) බස්නාහිර පළාත් මහාධිකරණය විසින් ඉහත නම් සඳහන් සමාගම ඈවර කිරීම පිණිස පෙත්සමක්, 2019 ක් වූ අගෝස්තු මස 19 වන දින එකී අධිකරණය වෙත පෙත්සම්කරු වෙනුවෙන් ඩී. එල් සහ එෆ් ද සේරම් මහතුන් විසින් ඉදිරිපත් කර ඇති බව ද, එකී පෙත්සම 2019 ක් වූ ඔක්තෝබර් මස 21 වන දින අධිකරණය ඉදිරියෙහි විභාග කරනු ලැබීමට නියම කර ඇති බව ද, එකී පෙත්සම මත නියෝගයක් කිරීම තහවුරු කිරීමට හෝ ඊට විරුද්ධ වීමට හෝ කැමති, එකී සමාගමේ කිසියම් ණයහිමියෙකු හෝ සහදායකයෙකු වේ නම් ඒ තැනැත්තාට තත් කාර්ය සඳහා එය විභාග කරන අවස්ථාවෙහි පෞද්ගලිකව හෝ තමාගේ නීතිඥවරයා මාර්ගයෙන් හෝ පෙනී සිටිය හැකි බව ද, පෙත්සමේ පිටපතක් අවශ්‍ය වන එකී සමාගමේ ඕනෑම ණයහිමියෙකුට හෝ සහදායකයෙකුට ඒ සඳහා නියමිත ගාස්තුව ගෙවූ විට පහත සඳහන් අය විසින් සපයනු ලබන බව ද, මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩී. එල්. සහ එෆ් ද සේරම් මහත්වරු,
අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස,
කොළඹ 07.

*සටහන* :- එකී පෙත්සම විභාග කෙරෙන අවස්ථාවෙහි පෙනී සිටීමට කැමති ඕනෑම තැනැත්තෙකු විසින් තමා එසේ කිරීමට අදහස් කරන බවට ලිඛිත දැන්වීමක් ඩී. එල්. සහ එෆ් ද සේරම් මහතුන් වෙත භාරදිය යුතුය. නැතහොත් තැපෑලෙන් එවිය යුතුය. එම දැන්වීමෙහි එම තැනැත්තාගේ නම සහ ලිපිනය ද, ව්‍යාපාර ආයතනයක් නම් ව්‍යාපාර ආයතනයේ නම සහ ලිපිනයද, සඳහන් කළ යුතු අතර, එය එම තැනැත්තා හෝ ව්‍යාපාර ආයතනය විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ (නීතිඥවරයෙකු වෙතොත්) එම නීතිඥවරයා විසින් අත්සන් කළ යුතුවාක් මෙන්ම 2019 ක් වූ ඔක්තෝබර් මස 20 වන දින සවස 6.00 ට පෙර ලැබෙන ලෙස භාරදිය යුතුය. නැතහොත් තැපෑලෙන් එවන්නේ නම් එදින එකී වේලාවට පෙර ලැබෙන ලෙස කල්වේලා ඇතිව තැපැල් කළ යුතුය.

10-381

---

## සිය සිවිල් අධිකරණ බලය කොළඹ දී ක්‍රියාත්මක කරනු ලබන බස්නාහිර පළාත්බද මහාධිකරණයේ දී ය

නඩු අංකය : HC Civil 67/19/CO
ස්වභාවය : ගණන් බේරා වසා දැමීම
කාර්ය පටිපාටිය : ලඝු
වටිනාකම : රු.

රත්මලාන, කටුකුරුඳුවත්ත පාරේ, අංක 24 දරන ස්ථානයේ ලීඩර් පබ්ලිකේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් පිළිබඳ කාරණය සම්බන්ධයෙනි.

*සහ*

2007 අංක 07 දරන සමාගම් පනතේ XII දරන කොටස යටතේ අධිකරණය මගින් ගණන් බේරා වසා දැමීම සඳහා අයදුම්පත පිළිබඳ කාරණය සම්බන්ධයෙනි.

රත්මලාන, කටුකුරුඳුවත්ත පාරේ, අංක 24 දරන ස්ථානයේ ලීඩර් පබ්ලිකේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

...............................*පෙත්සම්කරු.*

කොළඹ දී පවත්වනු ලබන (සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන) බස්නාහිර පළාත් මහාධිකරණය විසින් ඉහත නම් සඳහන් සමාගම ඈවර කිරීම පිණිස පෙත්සමක්, 2019 ක් වූ අගෝස්තු මස 19 වන දින එකී අධිකරණය වෙත පෙත්සම්කරු වෙනුවෙන් ඩී එල් සහ එෆ් ද සේරම් මහතුන් විසින් ඉදිරිපත් කර ඇති බව ද, එකී පෙත්සම 2019 ක් වූ ඔක්තෝබර් මස 21 වන දින අධිකරණය ඉදිරියෙහි විභාග කරනු ලැබීමට නියම කර ඇති බව ද, එකී පෙත්සම මත නියෝගයක් කිරීම තහවුරු කිරීමට හෝ ඊට විරුද්ධ වීමට හෝ කැමති, එකී සමාගමේ කිසියම් ණයහිමියෙකු හෝ සහදායකයකු වේ නම් ඒ තැනැත්තාට තත් කාර්ය සඳහා එය විභාග කරන අවස්ථාවෙහි පෞද්ගලිකව හෝ තමාගේ නීතිඥවරයා මාර්ගයෙන් හෝ පෙනී සිටිය හැකි බව ද, පෙත්සමේ පිටපතක් අවශ්‍ය වන එකී සමාගමේ ඕනෑම ණයහිමියෙකුට හෝ සහදායකයෙකුට ඒ සඳහා නියමිත ගාස්තුව ගෙවූ විට පහත සඳහන් අය විසින් සපයනු ලබන බව ද මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩී. එල්. සහ එෆ් ද සේරම් මහත්වරු,
අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස,
කොළඹ 07.

*සටහන* :- එකී පෙත්සම විභාග කෙරෙන අවස්ථාවෙහි පෙනී සිටීමට කැමති ඕනෑම තැනැත්තෙකු විසින් තමා එසේ කිරීමට අදහස් කරන බවට ලිඛිත දැන්වීමක් ඩී. එල්. සහ එෆ් ද සේරම් මහතුන් වෙත භාරදිය යුතුය. නැතහොත් තැපෑලෙන් එවිය යුතුය. එම දැන්වීමෙහි එම තැනැත්තාගේ නම සහ ලිපිනය ද, ව්‍යාපාර ආයතනයක් නම් ව්‍යාපාර ආයතනයේ නම සහ ලිපිනය ද, සඳහන් කළ යුතු අතර, එය එම තැනැත්තා හෝ ව්‍යාපාර ආයතනය විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ (නීතිඥවරයෙකු වෙතොත්) එම නීතිඥවරයා විසින් අත්සන් කළ යුතුවාක් මෙන්ම 2019ක් වූ ඔක්තෝබර් මස 20 වන දින සවස 6.00 ට පෙර ලැබෙන සේ භාරදිය යුතුය. නැතහොත් තැපෑලෙන් එවන්නේ නම් එදින එකී වේලාවට පෙර ලැබෙන ලෙස කල්වේලා ඇතිව තැපැල් කළ යුතුය.

10-382

---

## කොළඹ දී පැවැත්වෙන (සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන බස්නාහිර පළාත් මහාධිකරණයේ දී ය)

නඩු අංකය : එච්. සී. (සිවිල්)/64/19/CO
ස්වභාවය : ඈවර කිරීම
වටිනාකම : රු. 203,444,801.24
පටිපාටිය : ලඝු

රත්මලාන, කඳවල මාවත, අංක 56 දරන ස්ථානයෙහි පිහිටි කමල් කේබල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සම්බන්ධයෙන් වූ ඉල්ලීමකි.

*සහ*

2007 අංක 07 දරන සමාගම් පනතේ XII කොටස යටතේ අධිකරණය මගින් ඈවර කිරීම සඳහා වූ ඉල්ලීමකි.

එල්. ඕ. එල්. සී. ෆැක්ටර්ස් ලිමිටඩ්,
ලියාපදිංචි කාර්යාලය අංක 100/1,
ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය.

*ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය* : අංක 504, නාවල පාර, රාජගිරිය.

*........................පෙත්සම්කරු.*

ඉහත නම් සඳහන් වාණිජ මහාධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම සඳහා පෙත්සමක් රාජගිරිය, නාවල පාර, අංක 504 යන ලිපිනයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පිහිටි රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවත, අංක 100/1 යන ලිපිනයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි එල්. ඕ. එල්. සී. ෆැක්ටර්ස් ලිමිටඩ් සමාගම විසින් වර්ෂ 2019 ක් වූ අගෝස්තු මස 08 වන දින වාණිජ මහාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද බවත්, එම පෙත්සම වර්ෂ 2019ක් වූ නොවැම්බර් මස 18 වන දින අධිකරණය ඉදිරියේ විභාග කිරීමට විධාන කෙරුණ බවත්, එම පෙත්සමට අදාළ නියෝගයක් කිරීමට පක්ෂව හෝ විරුද්ධව කරුණු සැළ කර සිටීමට අපේක්ෂා කරන එකී සමාගමේ ණයහිමියන් හෝ සහදායකයෙක් වේ නම් ඒ සඳහා තමාම හෝ සිය නීති උපදේශකවරයා හෝ නීතිඥවරයා මගින් එම විභාගය පවත්වන අවස්ථාවේ දී පෙනී සිටිය හැකි බවත්, එකී පෙත්සමේ පිටපතක් ලබාගැනීම සඳහා නියමිත ගාස්තුව ගෙවූ විට එහි පිටපතක් අවශ්‍ය කරන එකී සමාගමේ යම් ණයහිමියෙකුට හෝ සහදායකයෙකුට පහත අත්සන් කරන අය විසින් සපයනු ලබන බවත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

*අත්සන් කළේ* : ශ්‍රීමාල් පොන්නම්පෙරුම,
අංක 22,
ෂේඩි ග්‍රෝව් ඇවිනියු,
කොළඹ 08.

*සටහන* :- එකී පෙත්සම විභාග කරන අවස්ථාවේ දී පෙනී සිටීමට අදහස් කරන කිසිවෙකු වෙතොත් එසේ කිරීමට තමා අදහස් කරන බවට ලිඛිත නිවේදනයක් ඉහත නම් සඳහන් ශ්‍රීමාල් පොන්නම්පෙරුම වෙත ගෙනැවිත් භාරදිය යුතු හෝ තැපෑලෙන් එවිය යුතු වේ. එම නිවේදනයේ එම අයගේ නම හා ලිපිනය හෝ ව්‍යාපාරික ආයතනයක් නම්, එම ව්‍යාපාරික ආයතනයේ නම හා ලිපිනය ද සඳහන් කොට එම අය විසින් හෝ එම ව්‍යාපාරික ආයතනය විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ හෝ නීතිඥවරයෙකු වෙතොත් ඔහු විසින් අත්සන් කොට ඉහත නම් සඳහන් අය වෙත වර්ෂ 2019 ක් වූ නොවැම්බර් මස 17 වන දින පස්වරු 6.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ ගෙනැවිත් භාර දිය යුතුය. *නැතහොත්* එපරිදි තැපෑලෙන් එවිය යුතුය.

ශ්‍රීමාල් පොන්නම්පෙරුම,
අංක 22,
ෂේඩි ග්‍රෝව් ඇවිනියු,
කොළඹ 08.

10-391

---

**මන්ද බුද්ධික අය සඳහා වූ ලංකා සංගමය : සංස්ථාගත කිරීමේ - ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

වේළුකුමාර් වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ අංක 53(1) දරන ස්ථාවර නියෝග යටතේ 1971 අංක 10 දරන ''මන්ද බුද්ධික අය සඳහා වූ ලංකා සංගමය'' ''(සීඒඑම්ආර්/CAMR)'' ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට මම අදහස් කරන බව මෙයින් දැනුම් දෙමු.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ සංගමයේ නම ''බුද්ධිමය දුබලතා අය සඳහා වූ ශ්‍රී ලංකා සංගමය'' (ඒඅයිඩීඑස්එල්/AIDSL) යනුවෙන් සංශෝධනය කිරීම සහ ව්‍යවස්ථාවේ ඇති ඡේද අවශ්‍ය නම් මහා සභාවේ අනුමැතිය ඇතිව වෙනස් කිරීමටය.

වේළුකුමාර්,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
මහනුවර දිස්ත්‍රික්කය.

10-392

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.